# KEY FACT DOCUMENT
## වෙළඳ සේවා

| | |
|---|---|
| සුදුසුකම් | වයස අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකිකයෙකු වීම |
| සේවාවන්හි ස්වභාවය | වෙළඳ සේවා යනු පොලී රහිත සේවා එකතුවක් වන අතර ඒවා සාධාරණත්වය හා සමානත්වය යන මූලධර්ම පදනම් කරගෙන සැලසුම් කර ඇත. නිසි සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ට ඔවුන්ගේ ජාතිකත්වය කුමක් වුවද මෙම සේවාවන් ලබාගත හැකි වේ. මෙම සේවාවන් සියල්ල ෂරියා අධීක්ෂණ සභාවක් මගින් අනුමත කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය කරනු ලබන මෙම සේවාවන් නිරන්තරයෙන් ෂරියා විගණනයන්ට යටත් වේ. |
| සේවා වර්ග | **ආනයන**<br>Docimentary Credit (Sight සහ Usance) යටතේ ආනයනය/ Collcetion (DP සහ DA) යටතේ ආනයනය/ ආනයන  මූල්‍ය පහසුකම්/ නැව්ගත කිරීමේ ඇපකර<br><br>**අපනයන**<br>Collcetion (DP සහ DA) යටතේ අපනයනය/ Docimentary Credit (Sight සහ Usance) යටතේ අපනයනය<br><br>**ඇපකර**<br>සාමාන්‍ය ඇපකර/ රේගු බැඳුම්කර/ ලංසු බැඳුම්කර/ කාර්යසාධන ඇපකර/ අත්තිකාරම් ගෙවීම් ඇපකර<br><br>**වෙනත් සේවාවන්**<br>වෙළඳ කටයුතුවලට අදාළ මෙහෙයුම් |
| ආනයන Murabaha (පිරිවැය + ලාභය) | Murabaha යනු භාණ්ඩයක් විකිණීමයි, එහිදී විකුණුම්කරු විසින් ගැනුම්කරුට තම පිරිවැයට එකතු කරන ලද එකඟ වූ ලාභයක් මත නිශ්චිත භාණ්ඩයක් (ආනයන තොගයක්) ලබා දීමට එකඟ වේ.<br><br>**මූලික නීති**<br>Murabaha යනු භාණ්ඩයක් විකිණීමයි (ආනයන තොගය). එබැවින් එහිදී වලංගු ඉස්ලාමීය විකිණීමක් සඳහා අවශ්‍ය සියලුම කොන්දේසි සපුරාලිය යුතුය. එය වලංගු ගනුදෙනුවක් බවට පත්කිරීම සඳහා විකුණුම් ගිවිසුමට පහත සඳහන් නීති ඇතුළත් විය යුතු වේ.<br><br>1) විකිණීමේදී භාණ්ඩ පැවතිය යුතුය.<br>2) විකිණීමේදී භාණ්ඩ විකුණුම්කරුගේ අයිතිය යටතේ තිබිය යුතුය.<br>3) විකිණීමේදී භාණ්ඩ විකුණුම්කරුගේ භෞතික හෝ සංකේතීය හිමිකාරීත්වය යටතේ පැවතිය යුතුය.<br>4) විකිණීම ක්ෂණික හා නිරපේක්ෂ විය යුතුය. |

| | |
|---|---|
| | එබැවින් අමානා බැංකුව පළමුව භාණ්ඩ මිලදී ගෙන (ආනයනය), එය සංකේතීය හිමිකාරීත්වය යටතේ තබාගෙන පසුව එය පාරිභෝගිකයාට අලෙවි කරයි.<br><br>**සුරැකුම් / ඇපකර**<br>අමානා බැංකුවේ මැදිහත්වීම ආවරණය කිරීම සඳහා ගනුදෙනුකරු ප්‍රමාණවත් සුරැකුමක්/ ඇපකරයක් තැබිය යුතුය.<br><br>**ප්‍රධාන ලක්ෂණ**<br>• වත්කම් ඇපයට තබා ලබාගත හැකි මූල්‍ය පහසුකමකි.<br>• විනිවිදභාවයෙන් යුත් ස්ථාවර මිලකරණය<br>• භාණ්ඩ මිලදී ගැනීමේදී සහ විකිණීමේදී අමානා බැංකුව සම්පූර්ණ අයිතිය සහ අවදානම දරයි.<br>• ෂරියා විධිවිධානවලට අනුකූල වේ.<br>• සැඟවුණු පිරිවැය නොමැත<br>• පිරිසැකසුම් ගාස්තුවක් නොමැත<br>• පොලී අනුපාත ඉහළ පහළ යාමේ අවදානමක් නොමැත |
| ආනයනය Muswamma (එකවර ගෙවන මූල්‍ය පහසුකම්) | Musawamma යනු සරල ගනුදෙනුවක් වන අතර එහිදී විකුණුම්කරු තම භාණ්ඩය තම පිරිවැය හෙළිකිරීමෙන් තොරව අලෙවි කරයි. භාණ්ඩවල අමතර පිරිවැය ගණනය කිරීමට නොහැකි අවස්ථාවන්හිදී අමානා බැංකුව විසින් මෙම සේවාව පිරිනමනු ලැබේ.<br><br>අ) නැව්ගත කිරීමේ ලියකියවිලි ලැබීමට පෙර භාණ්ඩ තොගය පැමිණීම (නැව්ගත කිරීමේ ඇපකරය යටතේ නිෂ්කාශනය)<br><br>ආ) Usance/Acceptance ක්‍රමය යටතේ සැපයුම්කරුට සිදුකළ යුතු සැබෑ ගෙවීම ඉදිරි දිනයක සිදු කරන විට<br><br>Musawamma යනු වරායේ සිට පාරිභෝගිකයාගේ ගබඩාවට භාණ්ඩ නිෂ්කාශනය කිරීමට පහසුකම් සපයන, එකවර ස්ථාවර මිලකට භාණ්ඩ විකිණීමට ඉඩ සලසන මූල්‍ය පහසුකම් ක්‍රමවේදයකි. |
| ඇපකර ලිපි (Dhaman) | Dhaman යනු ණයගැතියෙකු, සැපයුම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු විසින් ඉටු කළ යුතු ඕනෑම හිමිකම් පෑමක්, ණය හෝ වගකීමක් වෙනුවෙන් කිසියම් පුද්ගලයෙකු ඇප වන ගිවිසුමකි. ආදාළ පාර්ශ්වයන් එම වගකීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් එහි වගකීම ඇපකරු වෙත පැවරේ. |
| ගාස්තු පදනම් කරගත් සේවා (Wakala) | Wakala යටතේ පවතින වෙළඳ සේවාවන් තුළදී එක් පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුට තමා වෙනුවෙන් යම් යම් ක්‍රියාවන් සිදු කිරීමට බලය දෙන අතර, අදාළ ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමට දෙවැන්නා බැඳී සිටී. මෙහිදී ගනුදෙනුකරු 'ප්‍රධාන පාර්ශ්වය' වන අතර බැංකුව ඔහුගේ |

| | |
|---|---|
| | නියෝජිතයා ලෙස ක්‍රියා කරයි. මෙහිදී බැංකුවෙන් කිසිදු ආකාරයක මූල්‍ය පහසුකම් සැපයීමක් සිදු නොකෙරේ. ගනුදෙනුවේ සම්පූර්ණ වටිනාකම ගනුදෙනුකරු විසින් ලබාදෙනු ලබන අතර, ගනුදෙනුකරු වෙත ලබාදෙන සේවාවන් වෙනුවෙන් ගාස්තුවක් අය කෙරේ. මෙය සියලුම වෙළඳ සේවාවන් සඳහා අදාළ වේ. |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ :https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |
| ප්‍රතිචාර සහ පැමිණිලි | ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත.<br><br>පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756<br>ඊමේල් : info@amana.lk \| feedback@amana.lk<br><br>ඔබගේ විමසීම් අපගේ වෙබ් අඩවිය හරහා යොමුකරන්න: www.amanabank.lk<br><br>කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මඟින් අප වෙත දැනුම් දෙන්න:<br><br>කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ<br>අමානා බැංකුව අංක 485, ගාලු පාර, කොළඹ 03<br>ඊමේල්: servicequality@amana.lk |
| | ඉහත සඳහන් ක්‍රම මඟින් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම්, ඔබට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවාව ලබාගත හැක.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පහත දැක්වේ.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන්,<br>අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 04<br>දුරකථන: + 94 11 2595624 ෆැක්ස්: +94 11 2595625 |